TRANSPARENCY INTERNATIONAL SRI LANKA
Building a Nation of Integrity

Media Release 2009/Sin/3

# මාධ්‍ය නිවේදනය

2009.01.08

### අන්තර්ජාතික සුපිළිපන් ප්‍රණාමලාභී

## ලසන්ත වික්‍රමතුංග ඝාතනය තරයේ හෙළා දකිමු

සන්ඩේ ලීඩර් කර්තෘ ලසන්ත වික්‍රමතුංග මහතාගේ ඝාතනය දැඩි ලෙස හෙළා දකින ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය ඒ පිළිබඳව සාතිශය සංවේගය පළකරයි.

ශ්‍රී ලංකාවේ දූෂණ වලට එරෙහිව පුරෝගාමී මෙහෙවරක නිරතව සිටි ජනමාධ්‍යවේදියකු වූ ලසන්ත වික්‍රමතුංග මහතා ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් අන්තර්ජාතික සුපිළිපන් ප්‍රණාමයෙන් (International Integrity Award) පිදුම් ලැබූවෙකි. ඔහු එම අන්තර්ජාතික සම්මානයට පාත්‍ර වූ මුල්ම ජනමාධ්‍යවේදියාද වෙයි.

අදහස් පළ කිරීමේ අයිතියට හා විසම්මුතියේ අයිතියට එරෙහිව සිරස මාධ්‍ය ජාලයට එල්ල වූ ප්‍රහාරය ඇතුළුව මෑත වකවානුව තුළ සිදු වූ සිද්ධි දමයත්, ලසන්ත වික්‍රමතුංග මහතාගේ මෙම සාහසික ඝාතනයත් මගින් යළි යළිත් තහවුරු වනුයේ රට තුළ නීතියේ ආධිපත්‍යය බිඳ වැටී ඇති ප්‍රමාණයයි.

ශ්‍රී ලංකාව තුළ යහපාලනයක් ස්ථාපිත කිරීම සඳහා මාධ්‍ය නිදහස අත්‍යාවශ්‍ය අංගයක් බව අවධාරණය කරන ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය, ආයුධ සන්නද්ධ කණ්ඩායම් වලට රිසිසේ රට තුළ සැරිසරමින් මෙවැනි සාහසික ඝාතන වල යෙදීමට හැකි පරිසරය වහා වෙනස් කරන ලෙසත්, මෙම සිද්ධි දමය පිළිබඳ නොපමාව අපක්ෂපාතී පරීක්ෂණයක් සිදු කරන ලෙසත් බලධාරීන්ගෙන් ඉල්ලා සිටී.

මෙම සිදුවීමට රාජ්‍යයයේ කිසිදු සම්බන්ධයක් නොමැති බව තහවුරු කළ හැකි වන්නේ මේ සම්බන්ධයෙන් අපක්ෂපාතී හා කඩිනම් පරීක්ෂණයක් පවත්වා ඊට වගකිවයුත්තන් නීති ඉදිරියට පමුණුවීමෙන් පමණි.

ජේ.සී. වැලිඅමුණ
විධායක අධ්‍යක්ෂ,
ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා